# පුස්තකාල පාඨකයින්ගේ තොරතුරු ගවේෂණ කුසලතා වර්ධනය කිරීම සඳහා කැලණිය විශ්වවිද්‍යාල පුස්තකාලයේ දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්

*පී.බී. ඉරේෂා මධුමාලි [1]*

**සංක්ෂේපය**

විශ්වවිද්‍යාල පුස්තකාලය, විශ්වවිද්‍යාලයක හදවත ලෙස හඳුන්වන අතර එහි මූලික කාර්යයන් වන අධ්‍යාපනය, පර්යේෂණ ප්‍රකාශනය සහ දැනුම සංරක්ෂණය උදෙසා පුස්තකාලයෙන් විශාල දායකත්වයක් ලැබෙන්නාසේම අධ්‍යාපන කාර්යයට අවශ්‍ය සම්පත් එකතුව ගොඩනැගීම, සංවිධානය, පවත්වාගෙන යාම සහ වර්ධනය කිරීම මත පදනම් වී පුස්තකාල පාඨක වර්ගය මත රඳා පවතී. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ තොරතුරු ගවේෂණය කුසලතා වර්ධනය කිරීමේදී ශාස්ත්‍රීය පුස්තකාලයක් ශිෂ්‍යයාට කොතරම් දුරට සහාය වන්නේ ද යන ගැටළුව පදනම් කරගෙන මෙම පර්යේෂණය සිදු කරන ලදී. අධ්‍යයනයේ මූලික අරමුණු වූයේ කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් තුල තොරතුරු කුසලතා වර්ධනය කිරීමේ දී පුස්තකාලය විසින් සංවිධානය කරනු ලබන වැඩසටහන් සහ ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේද මොනවාද යන්න ඇගයීම සහ ඒවායේ පවතින ගැටලු සහ අඩුපාඩු මොනවාද යන්න හඳුනාගැනීමත්, විද්‍යාර්ථීන්ගේ වර්තමාන තොරතුරු සෙවීමේ කුසලතා හඳුනාගැනීමත්ය. දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය ලෙස ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා යොදා ගත් අතර අහඹු නියැදිය යටතේ කාර්ය මණ්ඩල සේවකයින් 25 ක් සහ විද්‍යාර්ථීන් 100 මගින් දත්ත රැස් කරන ලදී. පර්යේෂණ සොයාගැනීම් අනුව උසස් අධ්‍යාපනය තුළ නිරතවන විද්‍යාර්ථීන් සඳහා විශ්වවිද්‍යාල පුස්තකාල කාර්යමණ්ඩලය විසින් තොරතුරු ගවේෂණය කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් වැඩසටහන් (විද්‍යාර්ථීන් අනුගත කිරීමේ නවක නම්නීකරණ වැඩසටහන්, පුස්තකාල දේශන, තොරතුරු ගවේෂණ ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්), පුස්තකාල චාරිකා, පුස්තකාල අත්පොත් ආදිය මගින් සහ මාර්ගගත ආකාරයෙන් ද දායකත්වය සපයන බව සොයා ගන්නා ලදී. නමුත් එම වැඩසටහන් සහ මඟ පෙන්වීම් පාඨකයා පොළඹවා ගැනීමට සහ පාඨකයා ආකර්ෂණය කර ගැනීමට සමත් නොවීම, සංකීර්ණ ගවේෂණ ක්‍රම පැවතීම, පාඨකයාට මාර්ගගත සූචිය පිළිබඳ දැනුවත්භාවයක් නොමැතිවීම ආදිය මෙහි දැකගත හැකි අඩුපාඩු වේ. පුස්තකාල දිශානති වැඩසටහන් මඟින් විද්‍යාර්ථීන්ට අවශ්‍ය මඟපෙන්වීම පුස්තකාල කාර්යමණ්ඩලය ලබා දුන් නමුත් විද්‍යාර්ථීන්ගේ කාර්යබහුල කාලසටහන් සමඟ ඒවාට සහභාගි වීමට නොහැකි බව ද සොයාගන්නා ලදී. අධ්‍යයනය අවසානයේ ප්‍රස්තුත වූයේ තොරතුරු තාක්ෂණය සහ තොරතුරු බහුලතාවය හේතුවෙන් ඉතා පහසුවෙන් සහ ඉක්මනින් තොරතුරු වෙත ප්‍රවේශ වීමට පුස්තකාල කාර්යමණ්ඩලය ප්‍රමාණවත් තරම් දායකත්වයක් දක්වන බවත් විද්‍යාර්ථීන් තුළ තොරතුරු ගවේෂණ ක්‍රම පිළිබඳ පුළුල් දැනුම් මට්ටමක් නොමැති බව සහ ඔවුන් පුස්තකාල භාවිතයට දක්වන ප්‍රමුඛතාවය අඩු බව සහ අන්තර්ජාලය තොරතුරු ගවේෂණය කිරීමේ ප්‍රධාන මාධ්‍ය බව අනාවරණය විය.

**මුඛ්‍ය පදඃ** *විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල පුස්තකාලය, පුස්තකාල සේවා, තොරතුරු තාක්ෂණය, තොරතුරු ගවේෂණ ශිල්ප ක්‍රම*

---

[1] madhumaliiresha80@gmail.com, පුස්තකාල හා විඥාපනවිද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය